සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 | S | I,II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **භරත නැටුම්** | **I, II** | **පැය තුනයි** |
| பரதநாட்டியம் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Bharatha Dancing | **I, II** | *Three hours* |

## භරත නැටුම් I

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. නමස්කාරය කිරීමේ දී වඳිනු ලබන්නේ,
(1) ගණ දෙවියන් ය. (2) නඩරාජර් ය. (3) භූමාදේවි ය. (4) සරස්වතී ය.

2. හිටගෙන සිට ආරම්භ කරනු ලබන අඩවුව කුමක් ද?
(1) තත්තෙයි තාම් (2) තෙයියා තෙයියී (3) තාතෙයි තෙයිද (4) තෙයිහත් තෙයිහී

3. 'අලාරිප්පු' නැටුම පිහිටා ඇති රාගය,
(1) නාට්ටයි ය. (2) සාවේරි ය. (3) වසන්තා ය. (4) මෝහනම් ය.

4. නලලට කෙළින් අංජලි හස්තම් කර නමස්කාර කරන්නේ,
(1) දෙවියන්ට ය. (2) ගුරුතුමාට ය. (3) සභාවට ය. (4) ප්‍රේක්ෂකයන්ට ය.

5. 'තලාංගුතෝම්' යන වචන කට්ටලය භාවිත වන පාද භේදය,
(1) මණ්ඩලම් ය. (2) උත්පිලවනම් ය. (3) බ්‍රහ්මරී ය. (4) පාදසාරිගා ය.

6. 'මායි මහා මාරියම්මා' යන ගීතයට කළ හැකි ගැමි නැටුම වන්නේ,
(1) කෝලාට්ටම් ය. (2) කුම්මි ය. (3) කාවඩි ය. (4) කරගම් ය.

7. 'පලිහ' පෙන්වීමට භාවිත කෙරෙන හස්තම් වන්නේ,
(1) සුගතුණ්ඩම් ය. (2) අරාලම් ය. (3) පදාහම් ය. (4) අර්ධචන්ද්‍රන් ය.

8. ගැමි සංගීත භාණ්ඩයක් වන්නේ,
(1) මෘදංගය ය. (2) උඩැක්කිය ය. (3) වයලීනය ය. (4) ගිටාරය ය.

9. කබිත්ත අත් දෙක හරස් අතට ඇල්ලූ විට ඇති වන සම්යුද හස්තම් වන්නේ,
(1) පාෂම් ය. (2) කීලහම් ය. (3) නාගබන්දම් ය. (4) පේරුණ්ඩම් ය.

10. 'ශිබිකයෝ' පෙන්වීමට භාවිත වන මුද්‍රාව,
(1) වරාහම් ය. (2) කූර්මම් ය. (3) කට්වා ය. (4) සම්බුඩම් ය.

[දෙවැනි පිටුව බලන්න.

11. 'ඉදුණු දිවුල් ගෙඩිය' පෙන්වීමට භාවිත වන හස්තම් වන්නේ,
(1) අලපත්මම් ය. (2) මුගුලම් ය. (3) පද්මකෝසම් ය. (4) සර්පසිරස් ය.

12. චමත්කාරයට සමාන කරනු ලබන්නේ,
(1) කුබේරන් ය. (2) විෂ්ණු දෙවියන් ය. (3) ශිව දෙවියන් ය. (4) මන්මදන් ය.

13. ස්වස්තික මණ්ඩලයේ සිට අභිනයෙන් කරන දසාවතාර වන්නේ,
(1) පරසුරාමර් සහ ශ්‍රී රාමර් ය. (2) පරසුරාමර් සහ පලරාමර් ය.
(3) පලරාමර් සහ ශ්‍රී ක්‍රිෂ්ණර් ය. (4) කූර්මම් සහ ශ්‍රී රාමර් ය.

14. දෙවි වන්දනාවක් ලෙස කරනු ලබන නැටුම් වන්නේ,
(1) අලාරිප්පු සහ ජදීශ්වරම් ය. (2) තෝඩයමංගලම් සහ මංගලම් ය.
(3) මල්ලාරි සහ ජදීශ්වරම් ය. (4) පුෂ්පාංජලී සහ අලාරිප්පු ය.

15. තංජෙ සහෝදරයන් ශිව දෙවියන් වෙනුවෙන් සේවයෙහි යෙදුණු දේවාලය වන්නේ,
(1) සෙංගනාර් දේවාලය ය. (2) වෛතීස්වරන් දේවාලය ය.
(3) සාරංගපානී දේවාලය ය. (4) තිරුවලන්චුලි දේවාලය ය.

16. නැමී නැමී නටනු ලබන ගැමි නැටුම,
(1) වඩමෝඩි ය. (2) වසන්තන් කුත්තු ය. (3) මුල්ලයිමෝඩි ය. (4) තෙන්මෝඩි ය.

17. 'සුජ්' මිශ්‍රණය ආලේප කර වාදනය කරනු ලබන භාණ්ඩය,
(1) සෙන්ඩයි ය. (2) වීණාව ය. (3) මෘදංගය ය. (4) වයලීනය ය.

18. මිශ්‍රජාති මට්ටිය තාලයේ සංකේතය,
(1) $1_3\ 1_3 0\ 0$ වේ. (2) $1_7\ 0\ 1_7$ වේ. (3) $1_7\ 1_7 0\ 0$ වේ. (4) $1_3\ 0\ 1_3$ වේ.

19. 'සලාමුරේ නමෝස්තුදේ' යනුවෙන් අවසන් වන උරුප්පඩිය,
(1) සප්තම් ය. (2) කවුත්තුවම් ය. (3) තෝඩයමංගලම් ය. (4) අලාරිප්පු ය.

20. වර්ණයේ උත්තරාංග කොටස යනු,
(1) පල්ලවි සහ අනුපල්ලවි ය. (2) පල්ලවි, මුක්තායිස්වරම් සහ සරණම් ය.
(3) පල්ලවි, අනුපල්ලවි සහ මුක්තායිස්වරම් ය. (4) සරණම් සහ සරණස්වරම් ය.

21. 'තකිට, තකතකිට' මෙහි පවතින නඩෛ දෙක වන්නේ,
(1) සඳුස්රම් සහ මිස්රම් ය. (2) තිස්රම් සහ කණ්ඩම් ය.
(3) තිස්රම් සහ මිස්රම් ය. (4) සඳුස්රම් සහ සංකීර්ණම් වේ.

22. ජයදේවර් විසින් රචනා කරනු ලැබූ උරුප්පඩිය,
(1) අශ්ටපති ය. (2) ජාවලි ය. (3) සප්තම් ය. (4) කීර්තනයි ය.

23. වැඩි වශයෙන් තමිල්නාඩුව සම්බන්ධ කතා ඉදිරිපත් කරනු ලබන කුත්තු (නැටුම) වන්නේ,
(1) වඩමෝඩි ය. (2) තෙන්මෝඩි ය. (3) මුල්ලයිමෝඩි ය. (4) වසන්තන් කුත්තු ය.

24. අරුණාසල කවිරායර් විසින් රචනා කරනු ලැබූ රාම නාටග කීර්තනයි වේදිකාගත කරනු ලැබූ ස්ථානය,
(1) මදුරාව ය. (2) මායුරම් ය. (3) කුම්බකෝණම් ය. (4) ශ්‍රීරංගම් ය.

25. නර්තනයට අඩව් නිර්මාණය කළේ,
(1) පොන්නයියා ය. (2) සින්නයියා ය. (3) සිවානන්දම් ය. (4) වඩිවේලු ය.

26. නට්ටුවාංග තාලයේ ලණුවෙන් අදහස් කරන්නේ,
(1) ඉර සහ සඳ ය. (2) රාහු සහ කේතු ය. (3) බ්‍රහ්ම සහ විෂ්ණු ය. (4) ශිව සහ පාර්වතී ය.

/තුන්වැනි පිටුව බලන්න.

27. රුහුණු නැටුමේ 'මාලක්කම්' යන උරුප්පඩියේ චලනය,
(1) වෘත්තාකාරව කැරකී නැටීමයි. (2) දෙපසට පැන පැන නැටීමයි.
(3) උඩ බලා පැන පැන නැටීමයි. (4) ඉදිරියට සහ පසුපසට යාමයි.

28. 'පාත්තිර බහි පිරාණන්' යන්නෙන් අදහස් කරන්නේ,
(1) නර්තනයෙහි යෙදෙන පිරිමි අයකුගේ ස්වරූපයයි.
(2) නර්තනයෙහි යෙදෙන ගැහැණු අයකුගේ ස්වරූපයයි.
(3) චරිතවල ගැළපෙන බව ය.
(4) උපකාරක සංගීතභාණ්ඩ ය.

29. තාලයක් නොමැතිව ගීත රාගයෙන් ගැයීමට අභිනයෙන් කරන උරුප්පඩිය,
(1) විරුත්තම් ය. (2) පුෂ්පාංජලී ය. (3) ජාවලි ය. (4) අෂ්ටපති ය.

30. 'අඟහරු' ග්‍රහයා අභිනයෙන් දක්වන අවස්ථාවේ දී යොදා ගනු ලබන පාද පිහිටුවීම,
(1) ආයත්තම් නම් වේ. (2) පිරේංකණම් නම් වේ.
(3) මුළුමණ්ඩි නම් වේ. (4) අරෛමණ්ඩි නම් වේ.

31. වාමන අවතාරයේ දකුණු සහ වම් මුෂ්ටි අත්වල අභිනයෙන් සංකේතවත් වන්නේ,
(1) පිහිය සහ කඩුව ය. (2) කුඩය සහ කමණ්ඩලය ය.
(3) වියගහ සහ නගුල ය. (4) දුන්න සහ ඊ තලය ය.

32. මෘදංගය සම්බන්ධයෙන් භාවිත කරනු ලබන වචන කට්ටලය හඳුන්වනු ලබන්නේ,
(1) කෝර්වෛ යනුවෙනි. (2) කදි යනුවෙනි.
(3) ලයම් යනුවෙනි. (4) ජදි යනුවෙනි.

33. තුන්වන කාලය දැක්වීමට භාවිත කරන සංකේතය කුමක් ද?
(1) — (2) ═ (3) / (4) //

34. මාමල්ලපුරයේ කැටයම් නෙළන ලද්දේ,
(1) සංග යුගයේ දී ය. (2) සංගමරුවිය යුගයේ දී ය.
(3) පල්ලව යුගයේ දී ය. (4) චෝල යුගයේ දී ය.

35. 'අභිනය තර්ප්පනම්' නම් ග්‍රන්ථයෙහි දැක්වෙන පරිදි 'සබයි' යනු,
(1) කට්පහ විරුට්චම් ය. (2) වේද ය. (3) ශාස්ත්‍ර ය. (4) කුරුම්ණියන් ය.

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

36. පුරාණ කාලයේ නර්තන කලාවේ විශේෂ නිපුණතා ලබා සිටි අයට ................................ යන ගෞරව නාමය ලබා දී ප්‍රශංසා කරනු ලැබී ය.
(1) ආස්තාන නර්තකි (2) කලාශූරි (3) තලයිකෝලි (4) කලාභූෂණ

37. අභිගුණ්ඨක කාන්තාව හඳුනාගැනීමට ............................ උපකාරී වේ.
(1) වළල්ල (2) කොණ්ඩය (3) මාලය (4) මන්ත්‍රණ යෂ්ටිය

38. සීයමංගලම් ගුහාවේ ඇති නඩරාජර් පිළිරුව ............................ රජ සමයේ නෙළන ලද්දකි.
(1) චෝල (2) පල්ලව (3) සේර (4) පාණ්ඩිය

39. සිවක්කොලුන්දු තේසිගර් විසින් රචනා කරන ලද සරබේන්දිර පූබාල කුරවන්ජි සහ මන්මද විලාශ යන නාට්‍ය දෙක තංජයි සහෝදරයින් විසින් ගීත නාටක ලෙසට හරවා ............................ දේවාලයේ වේදිකාගත කරන ලදී.
(1) වෛතීස්වරර් (2) සිදම්බරම් (3) ප්‍රකතීස්වරර් (4) තිරුවන්නාමලෙ

40. ලාල්කුඩි ජෙයරාමන් ............................ වාදනය කිරීමේ ප්‍රවීණයෙකි.
(1) වීණාව (2) සඩම් (3) මෘදංගය (4) වයලීනය

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

භරත නැටුම් I, II
பரதநாட்டியம் I, II
Bharatha Dancing I, II

## භරත නැටුම් II

* **පළමුවන** ප්‍රශ්නය හා අනෙකුත් ප්‍රශ්නවලින් **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. කෙටි පිළිතුරු සපයන්න.
   (i) 'තිත්තෙයින්දතාතෙයි' කුමන අඩව් වර්ගයට අයත් ද?
   (ii) 'සොට්රුනයි වේදියන්' තේවාරම් හි රාගය (පන්) කුමක් ද?
   (iii) 'තෙරුවෙලි' නාට්‍යයට පසු කාලයේ දෙනු ලැබූ නම කුමක් ද?
   (iv) තංජයි සිවු දෙනා ලැබූ ගෞරව නාමය කුමක් ද?
   (v) 'කුන්පාණ්ඩියන්' යනුවෙන් හඳුන්වනු ලැබූ රජතුමා කවුද?
   (vi) පහතරට නැටුම් සම්ප්‍රදායේ වයනු ලබන වැදගත් තාල භාණ්ඩය කුමක් ද?
   (vii) පුල්ලාංකුලල්වල ඉතා උසස් ශ්‍රැතිය ඇති ස්වරය ලබා දෙන සිදුර හඳුන්වන්නේ කෙසේ ද?
   (viii) නර්තනය කරන්නා උර බාහුවේ පලඳින ආභරණයේ නම කුමක් ද?
   (ix) මගුඩ අඩව් **දෙකක්** ලියන්න.
   (x) නර්තනයේ සඳහන් කරන දර්මින් **දෙක** මොනවා ද?

2. (i) නර්තන සම්ප්‍රදාය වැඩසටහනක් සකසන අවස්ථාවක ජදිය සහ ස්වර එක්කර නටනු ලබන උරුප්පඩිය කුමක් ද?
   (ii) එම උරුප්පඩියේ ලක්ෂණය ලියන්න.
   (iii) එම උරුප්පඩියේ දෙවන සංයෝගය තාල අංග සංකේත සමඟ ලියන්න.

3. පහත සඳහන් හස්තමුද්‍රාවලින් ප්‍රකාශ වන අදහස (විනියෝගම්) ඒවායේ අර්ථ සමග ලියන්න.
   (i) හම්ශාශ්‍යම් (ii) ශන්දම්සම්
   (iii) පුෂ්පපුඩහම් (iv) අවකිත්තම්

4. 'සභාපතික්කු වේරු තෙයිවම් සමානමාගුමා' යන තමිලියයි ගීය ගැයූ ගායකයාගේ ජීවිත කතාව සහ ඔහු කලාවට කළ සේවය පිළිබඳ ව ලියන්න.

5. පහත ඒවා ගැන කෙටි සටහන් ලියන්න.
   (i) කින්කිනි
   (ii) තිරුප්පාවයි
   (iii) පංචපානම්

6. චෝල යුගයේ කලා වර්ධනය සහ චෝල රජවරුන්ගෙන් නර්තන කලාවට සිදු වූ සේවය ගැන විස්තර කරන්න.

7. (i) සබරගමු නර්තනයේ බිහිවීම, එහි නර්තනය සකසන අවස්ථාව හා මෙහි භාවිත වන අංග (උරුප්පඩි) ද ලියන්න.
   (ii) මෙම නර්තනයට භාවිත කරනු ලබන භාණ්ඩය ඇඳ, එහි කොටස් නම් කරන්න.

***